ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
National Disaster Relief Services Centre
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை
Vidya Mawatha, Colombo 07, Sri Lanka
දු.අ. / தொ.எ / T.N. 0112665258
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112665702
වි.තැ. / மி.அ.மு. / Email sahana.ndrsc@gmail.com

මගේ අංකය / எனது இல / My No. NDRSC/01/01/01

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2024.06. 05

ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (II)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

<u>හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථාන වලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන උපදෙස්</u>

උක්ත කරුණ සම්බන්ධව අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් ආරක්ෂක ලේකම් අමතන ලද BD/NSLE/442/7/2022 හා 2022.06.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාවට බාධාවකින් තොරව සහන සැලසීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දැනට ක්‍රියාත්මක ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (I) හි ඡේද අංක 05 (IV), (V) හි සඳහන් පිසූ ආහාර හා වියළි සලාක වලට අදාළ උපරිම වියදම් සීමාවන් පහත පරිදි සංශෝධනය කරමි.

| කාරණය | 01/2020 චක්‍රලේඛය අනුව දැනට වැයකල හැකි උපරිම සීමාවන් රු. | | | සංශෝධිත උපරිම සීමාවන් රු. |
|---|---|---|---|---|
| පිසූ ආහාර | තනි පුද්ගලයෙකු වෙනුවෙන් | දිනකට (වේල් 03) | 450/- | 600/- |
| වියළි සලාක | තනි පුද්ගලයෙකු සඳහා | සතියකට | 1,350/- | 1,800/- |
| | සාමාජිකයන් 02කින් යුතු පවුලක් සඳහා | | 1,800/- | 2,400/- |
| | සාමාජිකයන් 03කින් යුතු පවුලක් සඳහා | | 2,100/- | 2,800/- |
| | සාමාජිකයන් 04කින් යුතු පවුලක් සඳහා | | 2,400/- | 3,200/- |
| | සාමාජිකයන් 05කින් යුතු පවුලක් සඳහා | | 2,700/- | 3600/- |

03. ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 2020 (I) හි අංක (IV) හි පිසූ ආහාර යටතේ වන දෙවන ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

"ඒ අනුව ආපදා තත්ත්වයකදී ආපදාවන්ට ලක්වී තම ස්ථිර පදිංචි ස්ථාන වලින් ඉවත් කර සුරක්ෂිත මධ්‍යස්ථාන වල රඳවා ඇති පුද්ගලයින් හා තම නිවාස වල පිසූ ආහාර පිළියෙල කර ගැනීමට නොහැකි ලෙස නිවාස ආපදාවෙන් බලපෑමට ලක්වී ඇති පුද්ගලයින්, ප්‍රවේශ මාර්ග අවහිර වීම හේතුවෙන් කොටුවී/ සිරවී සිටින පුද්ගලයින් ද ඇතුලත්ව ආදායම් මට්ටම නොසලකා පිසූ ආහාර සැපයිය හැකිය. ඒ සඳහා එක් පුද්ගලයෙකු වෙනුවෙන් දිනකට රු. 600/-ක උපරිමයකට යටත්ව වියදම් දැරිය හැකිය."

04. ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 2020 (I) හි අංක (V) හි වියළි සලාක යටතේ වන තෙවන ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

"ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ නිවෙස් වල රැඳී සිට ආපදාවේ බලපෑම අවසන් වූ වහාම තම නිවෙස් වලට එන පුද්ගලයින් හා ප්‍රවේශ මාර්ග අවහිර වීම හේතුවෙන් කොටුවී/ සිරවී සිටින පවුල් ද ඇතුලත්ව ඔවුන්ගේ ජන ජීවිතය යතාවත් කර ගැනීම සඳහා අවශ්‍යතාව අනුව සතියක කාලයක් දක්වා වියළි සලාකයක් ලබාදීම සිදුකළ හැකිය."

05. ඒ අනුව, ආපදා සහන සැලසීමේදී 2024.06.05 දින සිට ඉහත සඳහන් නව සීමාවන් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි. තවද ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (I) හි සඳහන් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතින බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. විගණකාධිපති